# ආයුර්වේද දෙපාර්තමේන්තුවේ
# අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය ( MN3 -2006 A)
# සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : ආයුර්වේද දෙපාර්තමේන්තුව යොමු අංකය :02/02/03/04/08 දිනය:2012.11.22

1.2 අමාත්‍යාංශය : දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යොමු අංකය: 01/04/135 III දිනය:2012.12.05

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය: DMS/C 02/37/01 දිනය:2010.10.11, 2010.11.16
DMS/002/BRI 2013.12.23

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමුඅංකය:EST-2/RECRU/02/0233 දිනය:2013.01.07

1.5 වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය:NPC/6/37/098/SR දිනය:2014.01.24

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමුඅංකය:PSC/EST/4//1/37/1/3/2013දිනය:2014.08.19

**02. පත්කිරීම් බලධරයා :-** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ආයුර්වේද කොමසාරිස්

**03. සේවා ගණය පිළිබඳ විස්තර :**

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

3.2 ශ්‍රේණි : III, II, I

3.3 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය :
ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන පිරිස් පාලනය, මුදල් භාරකාරීත්වය හා මුදල් පරිහරණය අධීක්ෂණය හා මෙහෙයුම් යන කාර්යයන් ඇතුලත් බහුකාර්ය (Multi Functional) ස්වරූපයේ කාර්යයන් ඉටුකරන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදුනොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරේ ස්වභාවය** : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

**05 වැටුප්**

5.1 වැටුප් කේත අංකය : MN3 -2006 A

5.2 වැටුප් පරිමාණය : රු. 15,005-4x180-6x240-11x320-20x360-27,885/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| III ශ්‍රේණිය | 01 පියවර | 15,005/ |
| II ශ්‍රේණිය | 12 පියවර | 17,485/- |
| I ශ්‍රේණිය | 23 පියවර | 21,045/- |

## 06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව - | කාර්යයන් |
|---|---|---|
| ගොවිපල කළමනාකරු | 05 | සේවක කළමනාකරණය, ආයතනයේ මුදල් කළමනාකරණය, ගොවිපලේ ගොඩනැගිලි උපකරණ , වාහන හා අනෙකුත් ප්‍රාග්ධන වත්කම් පරිපාලනය, නඩත්තු කිරීම කෘෂි විද්‍යාඥගේඋපදෙස් අනුව ගොවිපළ හා ඖෂධ උයන ප්‍රදර්ශනාත්මක මට්ටමෙන් පවත්වා ගෙන යාම |
| ව්‍යාප්ති නිලධාරී | 03 | ඖෂධීය ශාක පැලෑටි ව්‍යාප්ති සේවා සංවිධානය කිරීම, ඖෂධ පැලෑටි වගාකරුවන් දැනුවත් කිරීම, පාසැල් වැඩසටහන් පැවැත්වීම, ඖෂධ උයන් සංවර්ධන කටයුතු කෘෂි විද්‍යාඥගේ අධීක්ෂණය යටතේ ඉටු කිරීම හා දත්ත පවත්වාගෙන යාම. |
| ව්‍යාප්ති නිලධාරී (උද්භිද) | 02 | ඖෂධීය ශාක පැලෑටි ව්‍යාප්ති සේවා සංවිධානය කිරීම, ඖෂධ පැලෑටි වගාකරුවන් දැනුවත් කිරීම, පාසැල් වැඩසටහන් පැවැත්වීම, ඖෂධ උයන් සංවර්ධන කටයුතු කෘෂි විද්‍යාඥගේ අධීක්ෂණය යටතේ ඉටු කිරීම හා දත්ත පවත්වාගෙන යාම. |
| ව්‍යාප්ති නිලධාරී (කෘෂි) | 01 | ඖෂධීය ශාක පැලෑටි ව්‍යාප්ති සේවා සංවිධානය කිරීම, ඖෂධ පැලෑටි වගාකරුවන් දැනුවත් කිරීම, පාසැල් වැඩසටහන් පැවැත්වීම, ඖෂධ උයන් සංවර්ධන කටයුතු කෘෂි විද්‍යාඥගේ අධීක්ෂණය යටතේ ඉටු කිරීම හා දත්ත පවත්වාගෙන යාම. |
| කාර්මික නිලධාරී (ගොඩනැගිලි ඉදිකිරීම්) | 01 | ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළුම ආයතනවල වැඩබිම් වෙත ගොස් පරීක්ෂාකර බලා අවශ්‍යතාවය අනුව ඇස්තමේන්තු සකස් කිරීම.<br>ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් පරීක්ෂාව.<br>වැඩබිම් ප්‍රගති රැස්වීම් සඳහා සහභාගි වීම.<br>කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් සැකසීම.<br>ඉදිකිරීම් සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම.<br>සියළුම ගොඩනැගිලි නඩත්තු, අළුත්වැඩියා, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සහකාර කොමසාරිස් (සංවර්ධන)ට තාක්ෂණික සහාය ලබාදීම. |
| කාර්මික නිලධාරී (මෝටර් රථ) | 01 | වාහන අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු සම්බන්ධ ඇස්තමේන්තු පරීක්ෂා කර බැලීම.<br>වාහන අළුත්වැඩියාව හා නඩත්තු පරීක්ෂා කර බැලීම.<br>ආයතනයේ මෝටර් රථ වල ඉන්ධන තුලන වාර්තා පරීක්ෂා කිරීම.<br>වාහන මිලදී ගැනීම , අළුත්වැඩියා හා නඩත්තු කටයුතු වලදී ආයුර්වේද කොමසාරිස්හට තාක්ෂණික සහාය ලබාදීම. |
| තාක්ෂණික නිලධාරි | 14 | තාක්ෂණ විද්‍යාගාරයේ උපකරණ නිසිපරිදි පිළියෙල කිරීම හා ඒවායේ කටයුතු ක්‍රමවත් ආකාරයට සිදු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| | |
|---|---|
| ගොවිපල කළමනාකරු | 05 |
| ව්‍යාප්ති නිලධාරී | 03 |
| ව්‍යාප්ති නිලධාරී (උද්භිද) | 02 |
| ව්‍යාප්ති නිලධාරී (කෘෂි) | 01 |
| කාර්මික නිලධාරී (ගොඩනැගිලි ඉදිකිරීම්) | 01 |
| කාර්මික නිලධාරී (මෝටර් රථ) | 01 |
| තාක්ෂණික නිලධාරී | 14 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්කිරීමේ කාර්ය සඳහා III,II,I ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාළ නොවේ |

සටහන : I. III,II,I යන ශ්‍රේණීන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරඟ විභාගයෙන් බඳවාගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින් ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැක.

III. පුරප්පාඩු සංඛ්‍යාව 03ට අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

### 7.2.2 සුදුසුකම්

**7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්** :- (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර(උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)එකවර සමත්ව තිබීම

සහ

(ආ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,ගණිතය,විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින්(06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :

## ගොවිපල කළමනාකරු,ව්‍යාප්ති නිලධාරී

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව

හෝ

V. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

VI. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

VII. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

VIII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

## කාර්මික නිලධාරී (ගොඩනැගිලි ඉදිකිරීම්) / කාර්මික නිලධාරී (මෝටර් රථ)/ තාක්ෂණික නිලධාරී

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.2.2.3 **පළපුරුද්ද** : අදාල නොවේ.

7.2.2.4 **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 **වෙනත්** : I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 **වයස**

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 යි

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 30 යි

7.2.4 **බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : (ඇමුණුම 01)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

7.2.4.1.1 **පවත්වන බලධරයා :** විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ ආයුර්වේද කොමසාරිස් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

7.2.4.2 **වෘත්තීය පරීක්ෂණය :** අදාල නොවේ.

7.2.4.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.2.4.3.1 සාමාන්‍යගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :ආයුර්වේද කොමසාරිස්

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.2.5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** :රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,ගණිතය හා විද්‍යාව යන විෂයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06)කින් සමත්ව තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :

**ගොවිපල කළමනාකරු, ව්‍යාප්ති නිලධාරී**

i. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

iv. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව

හෝ

v. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

vi. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

vii. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

viii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**කාර්මික නිලධාරී (ගොඩනැගිලි ඉදිකිරීම්) / කාර්මික නිලධාරී (මෝටර් රථ)/ තාක්ෂණික නිලධාරී**

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.3.2.3 පළපුරුද්ද : ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.2.4 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත්

I. පත්වීම ස්ථිරකර තිබීම.

II. නියමිත දිනට පූර්වාසන්නව රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් සහතික කර තිබීම.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 7.3.2 සිට 7.3.3 දක්වා ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.3.3.1ලිඛිත විභාගය (ඇමුණුම 02)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

7.3.3.1.1 පවත්වන බලධරයා :විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ ආයුර්වේද කොමසාරිස් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

7.3.3.2 වෘත්තීය පරීක්ෂණය :අදාල නොවේ.

7.3.3.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7.3.3.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා: ආයුර්වේද කොමසාරිස්

7.3.3.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :අදාල නොවේ.

7.3.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය:

අභ්‍යන්තරව පළ කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයක් මගින්

7.4 කුසලතා මත බඳවා ගැනීම :-අදාල නොවේ.

08.කාර්යක්ෂමතා කඩඉම් -සියලුම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධි විධාන අනුව විය යුතුය.

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂා | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල ලබා ගත යුතුය |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය |

10. **ශ්‍රේණි උසස් කිරීම්**- ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධි විධාන අනුව විය යුතුය.

11 **තනතුරුවලට පත් කිරීම**

අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : මෙම බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් කොන්දේසි වලට අමතරව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් පොදු කොන්දේසි ද අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන :

* " සක්‍රිය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධි විධාන අනුව විය යුතුය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් "රාජ්‍ය සේවා කොමිෂන් සභාව " විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ :

අත්සන :

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

උදාරි වීරසිංහ

නම : සහකාර ආයුර්වේද කොමසාරිස්,

තනතුර : ආයුර්වේද දෙපාර්තමේන්තුව,

නාවින්න, මහරගම.

දිනය : 2015 . 03 . 23 .

පරීක්ෂා කලේ :

අත්සන :

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම: ඉන්දිකා අමරසිංහ

තනතුර : නියෝජ්‍ය කොමසාරිස්

දිනය : ආයුර්වේද දෙපාර්තමේන්තුව

නාවින්න, මහරගම.

2015 . 03 . 23 .

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

ඩී. එස්. කේ. ආර්. වීරකෝන්

නම : ආයුර්වේද කොමසාරිස්

ආයුර්වේද දෙපාර්තමේන්තුව

තනතුර : නාවින්න, මහරගම

දිනය : 2015 . 03 . 23 .

නිල මුද්‍රාව :

යොමු අංකය : 01/04/135 IV

ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :

නම :

ලේකම්

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

දිනය : 2015/04/21 නිල මුද්‍රාව :

වෛද්‍ය ඩී. එම්. ආර්. බී. [illegible]
ලේකම්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

---

යොමු අංකය : PSC/EST/4/1/37/1/3/2013

ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර -තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2014.08.19 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :

නම :

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්

දිනය : 2015.05.11 නිල මුද්‍රාව

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම 01

# විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම : ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවයේ III ශ්‍රේණියට අදාළ තනතුරු සඳහා විවෘත බඳවාගැනීමේ ලිඛිත පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා :විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ ආයුර්වේද කොමසාරිස් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | සංඛ්‍යාමය හැකියාව,ගැටළු නිරාකරණය,තර්කණ ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද විෂයානුබද්ධ කෙටි ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | I වන කොටස<br>පරිසරය,විද්‍යාත්මක සොයා ගැනීම්,විද්‍යා දැනුම,ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ ප්‍රශ්න වලින් යුක්තය.<br>II වන කොටස<br>විෂයානුබද්ධ ප්‍රශ්න වලින් යුක්තය. |

සකස් කළේ :

අත්සන :

(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ඉඳුනිල් වීරසිංහ

තනතුර : සහකාර ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම.

දිනය : 2015.03.23

පරීක්ෂා කළේ :

අත්සන :

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම: ඉන්දිකා අමරසිංහ

තනතුර : නියෝජ්‍ය කොමසාරිස් ආයුර්වේද දෙපාර්තමේන්තුව නාවින්න, මහරගම.

දිනය : 2015.03.23.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ඩී. එස්. කේ. ආර්. වීරකෝන්

තනතුර : ආයුර්වේද කොමසාරිස් ආයුර්වේද දෙපාර්තමේන්තුව නාවින්න, මහරගම

දිනය : 2015.03.23

නිල මුද්‍රාව :

ඇමුණුම 02

01. විභාගයේ නම : ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ III ශ්‍රේණියට අදාළ තනතුරු සඳහා සීමිත බඳවාගැනීමේ ලිඛිත පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා :විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ ආයුර්වේද කොමසාරිස් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | සංඛ්‍යාමය හැකියාව,ගැටළු නිරාකරණය,තර්කණ ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද විෂයානුබද්ධ කෙටි ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | I වන කොටස<br>පරිසරය,විද්‍යාත්මක සොයා ගැනීම්,විද්‍යා දැනුම,ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ ප්‍රශ්න වලින් යුක්තය.<br>II වන කොටස<br>විෂයානුබද්ධ ප්‍රශ්න වලින් යුක්තය. |

සකස් කළේ :

අත්සන :

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : උදාරි වීරසිංහ

තනතුර : සහකාර ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම.

දිනය : 2015 . 03 . 23

පරීක්ෂා කළේ :

අත්සන :

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම: ඉන්දිකා අමරසිංහ

තනතුර : නියෝජ්‍ය කොමසාරිස් ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම.

දිනය : 2015 . 03 . 23

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම

තනතුර :

දිනය : 2015 - 03 - 23

නිල මුද්‍රාව :